**ශීර්ෂය 325 - වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව පිළිබඳ විගණකාධිපති වාර්තාව 2015 වර්ෂය**

---

ශීර්ෂය 325 - වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුවේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2016 ජූලි 20 දින දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනිම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වි ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

## 1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකිම

---

විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148,149,150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරිම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරිම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකිම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරිමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරිම, ක්‍රියාත්මක කිරීම හා පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 2. ගිණුම්

---

### 2.1 විසර්ජන ගිණුම

---

**මුළු ප්‍රතිපාදනය හා වියදම**

---

දෙපාර්තමේන්තුව සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන136.92 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 89.38 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව දෙපාර්තමේන්තුව වෙත සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.මිලියන 47.54 ක් හෙවත් සියයට 34.72 ක ප්‍රතිපාදන ඉතිරි වි තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | 2015 දෙසැම්බර් 31 දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | |
| පුනරාවර්තන | 32.27 | 30.62 | 1.65 | 5.11 |
| මූලධන | 104.65 | 58.76 | 45.89 | 43.86 |
| **එකතුව** | **136.92** | **89.38** | **47.54** | **34.72** |

## 2.2 අග්‍රිම ගිණුම

දෙපාර්තමේන්තුව යටතේ වූ අංක 7002/0000/00/0409/0015/000 දරන අග්‍රිම ගිණුමේ 2015 දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය රු.මිලියන 2.45 ක් විය.

## 2.3 පොදු තැන්පත් ගිණුම

දෙපාර්තමේන්තුව යටතේ වූ අංක 6000/0000/00/0015/0171/000 දරන තැන්පත් ගිණුමේ 2015 දෙසැම්බර් 31 දිනට ශේෂය රු.මිලියන 1.08 ක් වී තිබුණි.

## 2.4 විගණන නිරීක්ෂණය

වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුවේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විසර්ජන ගිණුම ඉහත 1.1 ඡේදයේ දක්වා ඇති කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් විගණන නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවේ ඇතුළත් විගණන නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ 3 ඡේදයේ සඳහන් කර ඇත.

## 3. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ

## 3.1 අයවැය විචලනය

වැය විෂයයන් 05 ක් සඳහා අධි ප්‍රතිපාදන සලසා තිබීම නිසා සමාලෝචිත වර්ෂය අවසාන වන විට ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය එම වැය විෂයයන්ට අදාළ ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 25 ක සිට සියයට 100 ක් දක්වා පරාසයක ප්‍රමාණයක් වී තිබුණි.

## 3.2 යහ පාලනය හා ගිණුම් කටයුතුභාවය

### 3.2.1 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් සමාලෝචිත වර්ෂය සඳහා වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කර නොතිබුණි.

### 3.2.2 වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම

2006 මාර්තු 24 දිනැති අංක 128 දරන ජාතික අයවැය චක්‍රලේඛය ප්‍රකාරව වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙල කර නොතිබුණි.

### 3.2.3 වාර්ෂික කාර්යසාධන වාර්තාව

2002 සැප්තැම්බර් 12 දිනැති අංක 402 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් මුදල් වර්ෂය අවසාන වී දින 150 ක් ඇතුළත කාර්යසාධන වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු වුවත්, එම වාර්තාව 2016 ජුනි 16 දින වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

**3.3 වත්කම් කළමනාකරණය**

**---------------------------**

ප්‍රධාන කාර්යාලයේ ගබඩාව තුළ දීර්ඝ කාලයක් නිකුත් නොවී පවතින රු.164,920 ක් වටිනා විවිධ විෂයයන් 32 ක් නිරීක්ෂණය වූ අතර 2010 සහ 2011 වර්ෂවලදී මිලදීගත් රු.113,541 ක් වටිනා තොග විෂයයන් 16 ක් ද ඒ අතර විය.

**3.4 මතභේදයට තුඩුදෙන ගනුදෙනු**

**---------------------------------**

දෙපාර්තමේන්තුවේ ගනුදෙනු සම්බන්ධයෙන් සිදු කරන ලද නියැදි විගණන පරීක්ෂණවලදී පහත සඳහන් මතභේදයට තුඩු දෙන ගනුදෙනු නිරීක්ෂණය විය.

(අ) දෙපාර්තමේන්තුව සඳහා “6x9“ ප්‍රමාණයේ කළු ගල් මිලදී ගැනීමේදී අදාළ පළාත තුළ පවතින මිල ගණන් හෝ එම පළාතේ, පළාත් ඉංජිනේරු කාර්යාලවල පවතින මිල රේටයන් පිළිබඳව අවධානය යොමු කිරීමකින් තොරව ඇගයීම් කර මිලදී ගැනිම නිසා රු.136,030 ක් වැඩිපුර ගෙවා තිබුණි.

(ආ) ඉදිකිරීම් හා නඩත්තු කටයුතුවලට අදාළ ලිපිගොනු හා වැඩ පත්‍රිකා පරීක්ෂා කිරීමේදී දෙපාර්තමේන්තුව විසින් 2015 වර්ෂයට අදාළ ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කිරීමකින් තොරව ඉදිකිරීම් හා නඩත්තු කටයුතු සඳහා වර්ෂය පුරා ද්‍රව්‍ය මිලදී ගැනීම සිදු කර තිබුණි. එම ද්‍රව්‍ය සඳහා වර්ෂය තුළ ඒ ඒ කාර්යයන්ට අනුව වෙන වෙනම මිල කැඳවීම් ලබා ගැනීම හේතුවෙන් අවස්ථා විශාල ප්‍රමාණයකදී එකම ද්‍රව්‍ය විවිධ මිල ගණන් යටතේ මෙන්ම විවිධ වූ වර්ගයන් යටතේද මිල දී ගැනීමට කටයුතු කර තිබුණි. ඉදිරිපත් කර තිබූ තාක්ෂණික ඇගයීම් වාර්තා, ද්‍රව්‍යවල තත්ත්වයන් හා සන්නාමයන්, පිරිවිතරයන් පිළිබඳව අවධානය යොමු කිරීමකින් තොරව මිල පමණක් පදනම් කරගෙන කටයුතු කර තිබූ අවස්ථා නිරීක්ෂණය විය.

**3.5 මානව සම්පත් කළමනාකරණය**

**----------------------------------**

දෙපාර්තමේන්තුව සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් වෙනම කාර්ය මණ්ඩලයක් අනුමත කර නොතිබුණි. දෙපාර්තමේන්තුවේ කාර්යභාරය ඉටු කිරිමට ශ්‍රී ලංකා නාවික හමුදාවේ නිලධාරීන් 71 ක් හා නැවියන් 1111 ක් දිවිතියික පදනම මත අනුයුක්ත කර තිබුණි.